# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.04.26<br>පැය 1605 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/846/2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |


**අත්අඩංගුවට ගෙන නඩු කටයුතු අවසන් වූ හෙරොයින් කිලෝ 494 ග්‍රෑම් 48 ක ප්‍රමාණයක් විනාශ කිරීම - පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය**

ශ්‍රී ලංකාව මතින් තොර සුරක්ෂිත දේශයක් කිරීමේ උදාරතර සංකල්පය පෙරදැරි කොටගෙන ශ්‍රී ලංකා පොලිසිය විසින් අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණ මෙහෙයුම් සිදු කරනු ලබයි. මෙසේ අත්අඩංගුවට ගෙන නඩු කටයුතු අවසන් වූ හෙරොයින් මත්ද්‍රව්‍ය කිලෝ 494 ග්‍රෑම් 48 ක ප්‍රමාණයක් 2025.04.28 උදෑසන 10.00 ට INSEE' සිමෙන්ති සමාගමට අයත් පුත්තලම , පාලවිය පිහිටි උඳුනේදී විනාශ කිරීමට නියමිතය.

2021.12.15 වන දින ශ්‍රී ලංකා නාවික හමුදාව සහ පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශයේ නිලධාරීන් එක්ව සිදු කරන ලද වැටලීමකදී විදේශීය ජාතික පුද්ගලයින් 06 දෙනෙකු සන්තකයේ තිබී අත්අඩංගුව ගන්නා ලද හෙරොයින් මත්ද්‍රව්‍ය කිලෝ 250 ග්‍රෑම් 996 ක් හා 2022.04.19 වන දින ශ්‍රී ලංකා නාවික හමුදාව සහ පොලිස් මත්ද්‍රව්‍ය කායර්ංශය එක්ව සිදු කරන ලද වැටලීමකදී විදේශීය ජාතික සැකකරුවයන් 07 දෙනෙකු සන්තකයේ තිබී අත්අඩංගුවට ගන්නා ලද හෙරොයින් කිලෝ 243 ග්‍රෑම් 052 ක් 2025.04.28 වන දින INSEE' සිමෙන්ති සමාගමට අයත් පුත්තලම, පාලවිය පිහිටි උඳුනේදී විනාශ කිරීමට නියමිතය.

මෙම හොරොයින් මත්ද්‍රව්‍ය විනාශ කිරීම සඳහා මහාධිකරණය විසින් නිකුත් කර ඇති නියෝගය අනුව 2025.04.28 වන දින උදෑසන 07.00 ට කොළඹ මහධිකරණයෙන් භාර ගැනීමෙන් අනතුරුව විශේෂ පොලිස් ආරක්ෂාව යටතේ පුත්තලම පිහිටි දහන උඳුන වෙත රැගෙන යාම සිදු කරනු ලබයි.

කොළඹ මහධිකරණයෙන් මෙම හොරොයින් මත්ද්‍රව්‍ය භාර ගැනීමේ අවස්ථාව සඳහා මහජන ආරක්ෂක හා පාලරීමේන්තු කටයුතු අමාත්‍ය ආනන්ද විජේපාල මහතාගේ ප්‍රධානත්වයෙන් මහජන ආරක්ෂක ලේකම් විශ්‍රාමික ජොෂඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න මහතා හා වැඩබලන පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, රස පරීක්ෂක කායර්ාලය සහ අධිකරණ කායර් මණ්ඩලයේ නිලධාරීන් සහභාගී වීමට නියමිතය.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**